# දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

## කෘෂිකර්ම අමාත්‍යාංශය

## කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති කාර්ය මණ්ඩලය බඳවා ගැනීම (පැවරුම් මත)

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය (CSIAP) වසර පහක (5) කාලයක් සඳහා (2019 ජනවාරි සිට 2024 ජූනි දක්වා) ලෝක බැංකුවේ මූල්‍යාධාර (US$ මිලියන 125 ක්) සහිතව කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කෙරේ.

පළාත් 6 ක (දිස්ත්‍රික්ක 11 ක) – වයඹ පළාත (කුරුණෑගල, පුත්තලම), උතුරු මැද පළාත (අනුරාධපුරය, පොළොන්නරුව), නැගෙනහිර පළාත (ත්‍රිකුණාමලය, අම්පාර සහ මඩකලපුව), උතුරු පළාත (කිලිනොච්චිය, මුලතිව්), දකුණු පළාත (හම්බන්තොට) සහ ඌව පළාත (මොනරාගල) (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 35 ක) මෙම ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් උෂ්ණාධික ප්‍රදේශවල වාසය කරන ප්‍රජාවගේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ දේශගුණික ප්‍රකෘතිභාවය පුළුල් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ව්‍යාපෘති කාල සීමාව සඳහා පැවරුම් ක්‍රමය මත පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. ව්‍යාපෘති ඉංජිනේරුවන් (PS4-A කාණ්ඩය) - පළාත් මට්ටමින් තනතුරු 06 ක්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම

   සමග

   අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර අටක (08) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.
2. අදාළ ක්ෂේත්‍රයේ රජයේ සමස්ත දීප ව්‍යාප්ථ සේවාවේ III / II පංතියේ හෝ ඉහළ හෝ සමාන තත්ත්වයේ නිලධාරියෙකු වීම

   සමග

   III / II පංතියේ තනතුරක අවම වශයෙන් වසර 08 ක පළපුරුද්දක් ලබා තිබීම.

### 2. ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරීන් (PS 5) - දිස්ත්‍රික්ක මට්ටමින් සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකක වශයෙන් තනතුරු 15 ක්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම

   හෝ

   තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට (NVQ Level 7) නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

   සහ

   අවශ්‍ය විශේෂතා අංශයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම.
2. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 6 වන මට්ටමට (NVQ Level 6) නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

   සහ

   අවශ්‍ය විශේෂතා අංශයේ අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්දක් ලබා තිබීම.
3. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටමට (NVQ Level 5) නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

   සහ

   අවශ්‍ය විශේෂතා අංශයේ අවම වශයෙන් වසර පහළොවක (15) පළපුරුද්දක් ලබා තිබීම.

### 3. තාක්ෂණ නිලධාරීන් (PS 6) - දිස්ත්‍රික් මට්ටමින් හා ව්‍යාපෘති කළමනාකරණ ඒකක මට්ටමින් තනතුරු 44 ක්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක්

   හෝ

   අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන සුදුසුකමක් ලබා තිබීම

   හෝ

   තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට (NVQ Level 7) නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

   සමග

   අවශ්‍ය විශේෂතා අංශයේ අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් ලබා තිබීම

   හෝ
2. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට (NVQ Level 6) නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

   සමග

   අවශ්‍ය විශේෂතා අංශයේ අවම වශයෙන් වසර අටක (08) පළපුරුද්දක් ලබා තිබීම

   හෝ
3. තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තනතුරක් සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට (NVQ Level 5) නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම

   සමග

   අවශ්‍ය විශේෂතා අංශයේ අවම වශයෙන් වසර දහතුනක (13) පළපුරුද්දක් ලබා තිබීම.

### පොදු කොන්දේසි

අ. **වයස් සීමාව :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනයේදී වයස අවුරුදු 64 ට වැඩි අපේක්ෂකයන් අයදුම්කිරීමට නුසුදුස්සෝ වෙති.

ආ. **රැකියාවේ නියුක්ත කිරීම සඳහා වන කොන්දේසි :**

ආරක්ෂක සේවාවන්වල සේවය කරන නිලධාරීන් ද්විතීයනය පදනම මත හා රාජ්‍ය සේවාවෙන් බැහැර අයවලුන් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. සියලුම පත්වීම් මූලිකව වසරක කාලයක් සඳහා වන අතර, කොන්ත්‍රාත්තුවේ සහ තක්සේරුවේ සාර්ථක කාර්යසාධනය මත සේවා දීර්ඝ කිරීම් ලබා දෙනු ලැබේ.

ඇ. **වැටුප**

එක් එක් තනතුර සඳහා වන වැටුප 2019-03-05 දතම අංක 01/2019 කළමනාකරණ සේවා චක්‍රලේඛයට පදනම් වේ.

ඇ. **සම්මුඛ පරීක්ෂණය**

සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

### අයදුම්පත් :

- ජීව දත්ත සහිත ස්වකීය අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විස්තරද සහිතව සහතිකවල පිටපත් සමග 2021 පෙබරවාරි 21 වෙනි දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනය වෙත ලැබෙන පරිදි යොමු කරන මෙන් අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
- දැනට රාජ්‍ය / අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.
- එක් තනතුරකට හෝ පළාතකට හෝ දිස්ත්‍රික්කයකට වඩා අයදුම්කරන අයදුම්කරුවන් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර හා දිස්ත්‍රික්කය පැහැදිලිව සඳහන් කළ යුතුය. පළාත් මට්ටමින් අයදුම්කරන අයදුම්කරුවන් අයදුම්පත් බහා එවන කවරයේ තනතුර හා පළාත පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය,**
**කෘෂිකර්ම අමාත්‍යාංශය,**
**288, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**රාජගිරිය.**